# රාමායනය හා අනිකුත් විකෘති කිරීම් ප්‍රතික්ෂේප කිරීම නිසා මා ලැබූ අත්දැකීම්

හැගොඩ විපස්සී හිමි

පසුගිය වසර කිහිපයක සිට අප රටේ ඉතිහාසය හා ථෙරවාදී බුද්ධාගම විකෘති කිරිම ගැන මම පරීක්ෂණ කරමින් සිටිමි. මට වැටහී ගියේ, කිසියම් සංවිධානාත්මක පිරිසක් විසින් විශාල වශයෙන් පුවත්පත්වල ලිපි පල කරමින් හා පොත් ලියමින් මේ කාර්යයේ නියැලී සිටින බවයි. මේ ගැන උගතුන්ගෙන් විමසූ විට මට දැනගන්නට ලැබුණේ ඒවා අශාස්ත්‍රීය බැවින් සැලකිල්ලක් දැක්වීම අනවශ්‍ය බවයි. එහෙත් නොයෙක් දෙනා දුරකථනයෙන් හා ලිපි මඟින් එම කරුණු ගැන විමසීම නිසා මට වැටහුණේ බොහෝ සාමාන්‍ය ජනතාව එම විකෘති අදහස් පිළිගත් බව යි. උදාරහණයක් ලෙස එක් භික්ෂුන් වහන්සේ නමක් ලියා තිබුණේ, පටිච්චසමුප්පාදය යන්නෙහි අරුත ඉනේ බඳින පටිය බව යි. ඒවා හැඳින්විය හැක්කේ උමතු ප්‍රාකෘතය නමිනි. මේවායේ ආරම්භක කතෘ වශයෙන් හැඳින්විය හැක්කේ එක්තරා බුදු කෙනෙකි. ඒ අනුව එම විකෘති කිරීම් ගැන කටයුතු කිරීමට භික්ෂුවක් වශයෙන් මට සිදු වුණි.

සූරිය ගුණසේකර මහතා විසින් රාමායනය ගැන ලියා තිබූ ලිපියක් ඒ අවස්ථාවේ දී මට දැනගන්න ලැබිණ. එහි කරුණුවල මූලාශ්‍රය ගැන විමසූ විට ඒ මහතා කියා සිටියේ ඒවා දකුණු බුදු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණා රජුගේ සෙල් ලිපි නම් පොතෙන් උපුටා ගත් බවයි. එම රචකයා ශිලා ලිපි නිෂ්පාදනය කරන්නෙකු බව මම කළින්ම දැන සිටියෙමි. ඒ සඳහා සාක්ෂි මා සතු ය. ඒ අනුව නිගමනය කළ හැක්කේ රාවණා සම්බන්ධ කරුණු හා අනෙක් සියළුම විකෘති කිරීම් එම අසත්‍ය ලේඛන මත පදනම්ව කතෘ මණ්ඩලයක් මගින් පොත් පත් ලිවීම හා ලිපි පල කිරීම කරගෙන යනු ලබන බව යි. මේ අනුව එම ක්‍රියාමාර්ගයන්ට විරුද්ධව මා කටයුතු කරණ විට මට නොයෙක් තර්ජනාත්මක දුරකථන පණිවිඩ හා ලිපි ලැබෙන්නට විය. ඊට අමතරව අසභ්‍ය වචන යොදා මිහිඳු මහාරහතන් වහන්සේට හා සංඝමිත්තා මෙහෙණියට විරුද්ධ ලිපියක් ද මට ලැබුණි. ඒ අනුව මා විසින් ගල්කිස්ස පොලිසියට පැමිණිල්ලක් කරණ ලද අතර ඒ සම්බන්ධ නඩු විභාගය තවමත් පැවැත් වේ. මෙහෙ දී අවධානය යොමු කළ යුත්තේ රාවණා සම්බන්ධ විකෘති කිරීම් මෙම විශාල ව්‍යාපෘතියේ එක් කොටසක් පමණක් බව ය. උගතුන් විසින් නොසලකා හරින ලද හෙයින් එම විකෘති කිරීම් දැඩි සේ ව්‍යාප්ත වී පවතී. මේ ගැන රාජකීය ආසියාතික සංගමය මුල් වරට ශාස්ත්‍රීය වශයෙන් සලකා බැලීම ඉතාම කාලෝචිත ක්‍රියාවකි. ඒ නිසා ඉදිරියට එම කරුණ උගතුන්ගේ විශේෂ අවධානයට යොමු වී ජනතාවට නිවැරදි දැනුම ලබා දීමට කටයුතු කෙරෙණු ඇතැයි බලාපොරොත්තු වෙමි.